# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

## (2010 මැයි / ජූනි)

## මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රාසංගික කලා -PART –E2015

### ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි** **කාලය : පැය 03 යි**

---

01. උඩරට, පහතරට, සබරගමු බෙර වාදනයේ ධ්වනි නිෂ්පත්තිය සැලකිල්ලට ගනිමින් එම සම්ප්‍රදායන් තුනෙහි බෙර වාදනයේ සුවිශේෂිතා පිළිබඳව කරුණු විමසන්න.

02. වේෂ භූෂණය පහතරට නර්තන සම්ප්‍රදාය සම්බන්ධයෙන් වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

03. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනෙන් එක් සම්ප්‍රදායකට අයත් අංගහාර හා ගායනය එම සම්ප්‍රදායට අනන්‍ය වීම කෙරෙහි බලපා ඇති සාධක උදාහරණ සහිතව විමසන්න.

04. මින් මාතෘකා <u>(02)</u> **දෙකකට** අදාළව සටහන් සපයන්න.

    i. උඩරට නර්තන සම්ප්‍රදායේ නළු ඇඳුම් භාවිතය

    ii. සබරගමු මාත්‍රා පහ

    iii. කවුත්තම්

    iv. පංච තූර්ය වාදනය

05. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදා තුනෙන් එක් සම්ප්‍රදායක වන්නම් නිදසුන් වශයෙන් ගෙන ඒවායින් ප්‍රකට වන '<u>රස</u>' පිළිබඳ විවරණයක් කරන්න.

06. <u>**සව්දම්**</u> පිළිබඳ හැඳින්වීමක් කොට, අතීතයේ පැවති ගායනය හා නර්තනය පිළිබඳව ඉන් අනාවරණය වන තොරතුරු නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

07. උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන නැටුම් ප්‍රභේද හඳුන්වා එකිනෙක් ප්‍රභේද පිළිබඳ විස්තරයක් කරන්න.

08. 20 වන සියවසේ දෙවන භාගයේ සිට ශ්‍රී ලාංකේය නර්තන සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් පිළිබඳ සමාලෝචනයක් කරන්න.

******************************